**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති නඩු කටයුතු 11 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී සටහන් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කර තිබුණු රු.138,260 ක යතුරු පැදි 02 ක් මොටර් රථ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගිවිසුම්ගත වීමකින් හෝ වෙනත් බැඳීමකට යටත් වීමකින් තොරව පුස්තකාල ස්වයංක්‍රීය මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට හා සංවර්ධන ව්‍යාපෘති 03 ක ඇස්තමේන්තු මුදල එකතුව රු.27,069,400 ක් විවිධ ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මෙම කාර්ය ඉටු කිරීමට සැලසුම් කර ඇති අතර, ව්‍යාපෘති ඉටු කිරීමට ප්‍රමාද වී ඇති බව. | නිමකර ඇති වැඩ වල වටිනාකම පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මැදවල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයකින් ලබාගත් රු.540,000 ක එක්වන් මුදල පොදු තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ආපසු නොගෙවනු ලබන තැන්පතුවක් ලෙස ගිණුම්ගත කර ඇති බව. | ආදායමට ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 ක ශේෂ වලට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.848,400 ක වෙනසක් පැවතුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත | | | |
| (i) ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.29,260 ක දැන්වීම් පුවරු ගාස්තුව අයකර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ii) ත්‍රීරෝද රථ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,975,050 ක ත්‍රීරෝද රථ ගාස්තු අයකර නොතිබුණි. | ත්‍රීරෝද රථ සංගම් හඳුනාගෙන ආදායම් රැස් කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස්කර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.44,230,158 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,689,826 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,139,600 | 10,139,592 | 8,046,701 | 14,893,190 | 10,139,600 | 9,708,540 | 7,800,300 | 12,800,300 |
| (ii) | කුලී | 1,207,800 | 1,138,400 | 1,373,675 | 39,950 | 1,207,000 | 970,300 | 920,575 | 275,225 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,904,050 | 2,141,050 | 2,141,050 | - | 1,000,000 | 1,019,500 | 1,019,500 | - |
| (iv) | වෙනත් ආදායම් | 38,856,500 | 48,489,972 | 4,674,195 | 38,656,601 | 49,763,301 | 49,970,282 | 91,120 | (5,159,176) |
| | | 52,107,950 | 61,909,014 | 16,235,621 | 53,589,741 | 62,109,901 | 61,668,622 | 9,831,495 | 7,916,349 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් ශේෂය රු.14,893,190 ක් වූ අතර, ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 666 කින් එකතුව රු.5,860,087 ක වරිපනම් හිඟයක් පැවතුණි. | වරෙන්තු නිකුත් කර දේපල තහනමට ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වසර 05 කට වරක් වරිපනම්වලට අදාළ දේපල තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුකළ යුතු වුවද 2012 වර්ෂයේදී සිදුකරන ලද වරිපනම් තක්සේරුවක් මත පදනම්ව වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | නිසි පිරිදි දේපල තක්සේරු කළ යුතුය. |
| **(ආ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ආයතන 18 ක් සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් ලැබිය යුතු රු.72,000 ක ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | බලපත්‍ර ලබා ගැනීමට දැනුවත් කර ඇති බව. | අදාළ කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර නිකුත් කළ යුතුය. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,859,066 ක් හා මුද්දර ගාස්තු රු.54,889,228 ක් විය. | ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත දන්වා ඇති බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වාගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද මධ්‍යස්ථානයක්, ගලී රථ සේවාවක් හා සතිපොළක් යනාදී මහජන උපයෝගී සේවාවන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම කාර්යයන් ඉටු කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව පොදු සේවාවන් පවත්වා ගත යුතුය. |
| (ආ) | සුහසාධන කටයුතු ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැයෙන් රු.4,570,000 ක් ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණද එම කාර්යයන් ඉටු නොකර එම ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂ වලට මාරුකර තිබුණි. | අත්‍යාවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බැවින් ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වූ බව. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය අනුව මහජන සෞඛ්‍ය බලධාරියා ලෙස සභාව කටයුතු කළයුතු බව දැක්වුවද සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක පානීය ජල යෝජනා ක්‍රමයේ ජල සාම්පල් පරීක්ෂාවක් සිදු නොකර පානීය ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | අදාළ පාර්ශවයන් දැනුවත් කරන බව. | ජල සාම්පල් පරීක්ෂා කර පිරිසිදු ජලය බෙදාහැරිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක එකතුව රු.2,532,624 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂවල එකතුව රු.1,480,976 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.849,786 ක ශේෂ අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.98,048,620 ක් වූ අතර ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.31,795,554 ක් නිරවුල් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අවසන් වන අවස්ථාවේදී ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී සභාවේ සවිකර තිබුණු සූර්ය බලශක්ති පද්ධතිය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | මෝටර් රථ ශේෂය යටතේ දක්වා තිබුණු ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් මත කටයුතු කරන බව. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එකතුව රු.17,857,799 ක ට්‍රැක්ටර් ට්‍රේලරයක්, යන්ත්‍රෝපකරණ හා ජල උපකරණ තොගයක් වසර 01 ත් 24 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිරියේ දී අලුත්වැඩියා කර භාවිතා කරන බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | මැදවල බස් නැවතුම්පොල හා වෙළඳ සංකීර්ණය පිහිටි අංක 12 දරන උත්සව ශාලාව ඵලදායී කාර්යයකට යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | මෙම සභාවේ කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇති බව. | -එම- |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්මලේ හා කුරුඳුගහ මඩ පුස්තකාල පිහිටි ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම මැන පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් මැදවල ක්‍රීඩාපිටිය පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා වසර 09 ක කාලයක් තුල අත්පත් කර ගැනීමේ ගාස්තු, පරිපාලන වියදම්, වන්දි ගෙවීමේ හා මැනුම් ගාස්තු ලෙස එකතුව රු.1,564,617 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද, අයිතිය පවරාගෙන නොතිබුණි. | -එම- | -එම- |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව රු.9,000,000 ක ඇස්තමේන්තු අගයකින් ඉදිකල යුතු යහලතැන්න පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම අවිධිමත්ව අදියර 04 ක් යටතේ ඇස්තමේන්තු පිළියෙල කර කොන්ත්‍රාත්කාර සමිතියකට ඉදිකිරීම පවරා සමාලෝචිත වර්ෂය තුළ රු.9,000,000 ක් වැයකර තිබුණි. | ලියාපදිංචි සමිතියකින් ව්‍යාපෘතිය ඉටුකළ බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව සම්ප්‍රේෂණ රැහැන් මාර්ගයක් ඉදිකිරීම යනුවෙන් දක්වා සභාවට අයත් විගුහුම්පල සුසාන භූමියේ තිබූ තේක්ක හා කොස්ගස් 32 ක් කපා ඉවත් කර තිබුණි. | මහා සභා තීරණය මත කටයුතු කළ බව. | අදාළ අනුමැතීන් ලබාගත යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 14 ක පුරප්පාඩු 17 ක් ද එක් තනතුරක අතිරික්තතා 20 ක් ද පැවතුණි. | බඳවා ගැනීම් අත්හිටුවා ඇති බව හා ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් අභ්‍යාසලාභී නිලධාරීන් අනුයුක්ත කර ඇති. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **සේවක ණය** ඉකුත් වර්ෂයේ ස්ථාන මාරුවී ගොස් තිබුණු නිලධාරීන් තිදෙනෙකුගේ හා විශ්‍රාම ගොස් සිටි නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.143,473 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී වියදම් විෂයයන් 24 ක සියයට 30 සිට සියයට 98 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරි වසරේදී අයවැය ලේඛනය ඵලදායී පාලන කාර්යයක් ලෙස සැකසීමට කටයුතු කරන බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය වෙන්කරවා ගත යුතුය. |

**4.2 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ළඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යම් තරමකින් එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇති බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |